## ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
## ඇබෑර්තු

---

පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයේ **සහකාර වේත්‍රධාරී** තනතුර සඳහා මනා සෞඛ්‍ය තත්ත්වයකින් හා විශිෂ්ට චරිතයකින් යුතු ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

මෙහි පහත දැක්වෙන ආදර්ශ අයදුම් පත්‍රය ප්‍රකාරව පිළියෙල කරගත් අයදුම්පත්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත්ද සමඟ **2023 දෙසැම්බර් 22** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ **"පාර්ලිමේන්තුවේ මහ ලේකම්, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තමන් අයදුම්කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. (මෙම දැන්වීම www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේද ලබා ගත හැකිය.)

**1 වැටුප් පරිමාණය:-**

2016.11.07 දිනැති අංක 06/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ උපලේඛන I අනුව මෙම තනතුරට හිමි මාසික වැටුප් පරිමාණය රු.58,295-3x1,335/8x1,630/2x 2,170 - 79,680/- වේ. (සියලුම අතිරේක දීමනා සහිතව මෙම වැටුප් පරිමාණයට අදාළ අවම ආරම්භක දළ මාසික වැටුප රු. 128,000/- පමණ වේ).

**2 වයස් සීමාව:-**

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 40ට නොවැඩි විය යුතුය.

**3 අධ්‍යාපන සුදුසුකම්:-**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) මගින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් හෝ වෙනත් ආයතනයකින් උපාධියක් ලබා තිබීම.

**4 සේවා විස්තර:-**

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවක (නිත්‍ය) හෝ ශ්‍රී ලංකා පොලිස් සේවයේ අවුරුදු 8කට නොඅඩු සම්මානනීය සේවා කාලයක් ඇති ශ්‍රී ලංකා යුධ හමුදාවේ කපිතාන්/ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ලුතිනන්/ ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ පියාසර ලුතිනන් තනතුරක හෝ ශ්‍රී ලංකා පොලිසියේ සහකාර පොලිස් අධිකාරි නිලයක හෝ ඒ හා සමාන හෝ ඊට නොඅඩු තත්ත්වයේ නිලයක් දරන අයකු විය යුතුය.

**5 බඳවා ගැනීමේ ක්‍රමය:-**

ලිඛිත පරීක්ෂණයක් සහ/හෝ සම්මුඛ පරීක්ෂණයක් මඟිනි.

**6. සේවා නියමයන් හා කොන්දේසි:-**

(i) මෙම තනතුර ස්ථිරය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරුවන් යටත් විය යුතුය. තෝරා ගනු ලබන අයදුම්කරු මූලිකව වසර තුනක (03) පරිවාස කාලයකට යටත්ව පත් කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරනු ලැබූ පුද්ගලයෙක් තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය වසරක වැඩ බැලීමේ කාලයකට යටත්ව පත් කරනු ඇත.

(ii) තෝරා ගනු ලබන අයදුම්කරු පාර්ලිමේන්තුවේ මහ ලේකම්ගේ කාර්ය මණ්ඩලයට අදාළ වන මූල්‍ය හා දෙපාර්තමේන්තු රෙගුලාසිවලට යටත් වනු ඇත.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරු, රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයකට අනුව වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට තම වැටුපෙන් දායක මුදල් ගෙවිය යුතුය.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරු වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

(v) තෝරා ගනු ලබන අයදුම්කරු පත් කරනු ලැබීමට පෙර ඔහු/ඇය පිළිබඳව ආරක්ෂක නිශ්කාෂණ තොරතුරු වාර්තා ලබා ගනු ඇත.

7. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල පිටපත් (මුල් පිටපත් නොවේ) සිය අයදුම්පත්වලට අමුණා එවිය යුතු අතර, ඉල්ලා සිටින විටෙක මුල් පිටපත් ඉදිරිපත් කළ යුතුය:-
   (අ) උප්පැන්න සහතිකය
   (ආ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කෙරෙන සහතික
   (ඇ) සේවා විස්තර සනාථ කෙරෙන සහතික

8. අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ සන්නද්ධ හමුදාවේ හෝ පොලිස් සේවයේ ප්‍රධානියා මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

9. තනතුරු ලබා ගැනීමේ අරමුණින් කවර හෝ ආකාරයකින් බලපෑම් කිරීම තනතුර සඳහා නුසුදුසුකමක් වනු ඇත.

10. අයදුම්පත්‍රයෙහි සඳහන් වන කවර කරුණක් හෝ වැරදි යැයි යමකු තෝරා ගැනීමට පෙර සොයා ගනු ලැබුවහොත්, ඔහු/ ඇය නුසුදුස්සකු බවට නම් කරනු ලැබීමට ද, පත් කිරීමෙන් පසු එසේ අනාවරණය වුවහොත්, සේවයෙන් පහ කරනු ලැබීමට ද හේතු වනු ඇත.

11. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පසුව එවනු ලබන හෝ ඉහත සඳහන් කළ සහතිකවල පිටපත් රහිතව එවනු ලබන හෝ අදාළ සන්නද්ධ හමුදාවේ හෝ පොලිස් සේවයේ ප්‍රධානින් හරහා එවනු නොලබන හෝ ආදර්ශ අයදුම් පත්‍රය ප්‍රකාරව පිළියෙල නොකරන ලද අයදුම්පත් ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ
2023 දෙසැම්බර් 05 වැනි දින.

# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

## ආදර්ශ අයදුම්පත්‍රය

## සහකාර වේත්‍රධාරී තනතුර

01. (අ) මුලකුරු සමග නම (සිංහලෙන්/දෙමළෙන්) :-
.......................................................................................
.......................................................................................

(ආ) මුලකුරු වලින් හැඳින්වෙන නම් (සිංහලෙන්/දෙමළෙන්):-
.......................................................................................
.......................................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්):-
.......................................................................................
.......................................................................................
.......................................................................................

02. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | | | |

03. (අ) පෞද්ගලික ලිපිනය:-
.......................................................................................
.......................................................................................

දුරකථන අංකය :-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ආ) කාර්යාලයීය ලිපිනය:-
.......................................................................................
.......................................................................................

දුරකථන අංකය:-

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

(ඇ) ප්‍රවේශ පත්‍රය තැපැල් කළ යුතු ලිපිනය

පෞද්ගලික ☐ කාර්යාලයීය ☐

04. (අ) උපන් දිනය :- ................................................
(උප්පැන්න සහතිකයේ පිටපතක් අමුණා එවිය යුතු ය.)

(ආ) අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :- අවුරුදු ....... මාස ....... .දින .......

05. විවාහක/ අවිවාහක බව: - (විවාහක / අවිවාහක)

06. ස්ත්‍රී / පුරුෂ භාවය :- (ස්ත්‍රී/ පුරුෂ)

07 . ශ්‍රී ලංකාවේ පුරවැසියකු ද යන බව:- (ඔව් / නැත)

08. අධ්‍යාපන සුදුසුකම්:- (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)
අ.පො.ස. (සා/පෙළ) වර්ෂය - ........................

| විෂයය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

අ.පො.ස. (උ/පෙළ) වර්ෂය - .......................

| විෂයය | සාමාර්ථය | වර්ෂය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

09. උසස් අධ්‍යාපන සුදුසුකම්:- (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

විශ්වවිද්‍යාලය -............................................................................................................
උපාධිය - ......................................................................................................................
වර්ෂය - ........................................................................................................................

10. සේවා විස්තර (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

| ආයතනය | තනතුර | සේවා කාලය |
|---|---|---|
| | | |
| | | |

11. වත්මන් රැකියාව පිළිබඳ විස්තර:-
   (අ) ආයතනයේ නම හා ලිපිනය:-......................................................................
   (ආ) මුල් පත්වීමේ දිනය:-.............................................................................
   (ඇ) දැනට දරන තනතුර:-...............................................................................
   (ඈ) මාසික මූලික වැටුප :-............................................................................
   (ඉ) දීමනා :-...............................................................................................
   (ඊ) දළ වැටුප:-............................................................................................

12. ඔබ කිසියම් සාපරාධී ක්‍රියාවකට උසාවියක දී වැරදිකරු වී ඇත් ද? (ඔව්/නැත)
   එසේ නම් ඒ පිළිබඳ විස්තර දක්වන්න:-
   ..............................................................................................................

13. ඔබ මීට පෙර රජය යටතේ සේවය කර තිබේ ද ? (ඔව්/නැත)
   එසේ නම් එම විස්තර සඳහන් කරන්න.
   ..............................................................................................................

ම විසින් මෙම අයදුම්පත්‍රයෙහි සඳහන් කර ඇති තොරතුරු සියල්ල සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. මෙහි සඳහන් යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට මා තෝරා ගැනීමට පෙර හෙළි වුවහොත්, මෙම තනතුර සඳහා මා නුසුදුස්සකු වීමටත්, තෝරා ගැනීමෙන් පසු හෙළි වුවහොත් වන්දියක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටත් හේතුවන බව දනිමි.

දිනය :.............................                ..............................................
අයදුම්කරුගේ අත්සන

------------------------------------------------------------------------------------------------

**<u>දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ සහතිකය</u>**

පාර්ලිමේන්තුවේ මහ ලේකම්,

මෙම ආයතනයේ ................................ නිලය දරන, ................................ මයා/මිය/ මෙනෙවියගේ අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි. ඔහු / ඇය මෙම තනතුරෙහි ස්ථිර කර ඇති / නොමැති බවත්, ඔහුගේ / ඇයගේ වැඩ සහ හැසිරීම සතුටුදායක බවත්, ඔහුට හෝ ඇයට එරෙහිව විනයානුකූල කටයුතු කිසිවක් නොමැති බවත්, එවැනි කරුණක් පිළිබඳව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත් සහතික කරමි. ඔහු/ ඇය මෙම තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත්, සේවයෙන් නිදහස් කළ හැක. (කරුණාකර අනවශ්‍ය වචන කපා හරින්න.)

දිනය : ..............................                ......................................................
දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානියාගේ අත්සන
(නිල මුද්‍රාව)